**ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව - 2022**

**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය,හිමිකම් වෙනස්වීමේ වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංස්ථාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01 ට අනුව කල්පිරීමේ කාලය වර්ෂයක් වන ස්ථාවර තැන්පතු ජංගම වත්කම් ලෙස මූල්‍ය තත්ව ප්‍රකාශනයේ දැක්විය යුතු වුවද කල්පිරීමේ කාලය වර්ෂයක් වූ ස්ථාවර තැන්පතු වටිනාකම රු.232,373,251 ක් ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි. | 2012 වර්ෂයේ සිට ක්‍රියාත්මක නව ගිණුම් ප්‍රමිත වෙනස්වීමත් සමග ඒ අනුව ආයෝජන වටිනාකම් වර්ගිකරණ සිදු කරන ලදී. මෙම ආයෝජන වර්ෂයක් කල් පිරුන පසු නැවත ආයෝජනය (Held to Maturity) පිණිස පවත්වාගෙන යන බැවින් ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත අංක 01 අනුව ( ප්‍රමිත අංක 01- 66 වගන්තිය අනුව ) ජංගම නොවන වත්කම් යටතේ දක්වා ඇත.<br>තවද මෙම ආයෝජන 2012 වර්ෂයේ සිටම ඉහත ආකාරයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ප්‍රමිතියේ විධිවිධාන අනුව කටයුතු කලයුතුය |
| (ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 79 වගන්තිය අනුව දැනට භාවිතයේපවතින සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපල පිරියත හා උපකරණ වල දල ධාරණ අගය මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කල යුතු වුවද සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පිරිවැය රු.3,562,150,536 ක් වූ දේපල පිරියත හා උපකරණ පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | දේපල,පිරියත හා උපකරණ යටතේ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද එහෙත් දැනට භාවිතයේ පවතින වත්කම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනයන්හි 3.3 යටතේ දක්වා ඇති අතර උප ලේඛණයෙහි රු.3,562,150.536 ක් වූ වටිනාකමට අදාල වත්කම් දක්වා ඇත. | ප්‍රමිතියේ විධිවිධාන අනුව කටයුතු කලයුතුය |
| (ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 24 (LKAS 24) හි 17 වැනි වගන්තිය අනුව මූල්‍ය ප්‍රකාශනවල සම්බන්ධිත | ප්‍රමිත අංක 24 අනුව වාර්ෂික මූල්‍ය ප්‍රකාශයන්හි ආශ්‍රිත පාර්ශවයන් සම්බන්ද ගණුදෙනු හෙළිදරව් කිරීමට කටයුතු කර ඇති අතර 2022 වර්ෂයේ මූල්‍ය | ප්‍රමිතියේ විධිවිධාන අනුව කටයුතු කලයුතුය |

| | | |
|---|---|---|
| පාර්ශවයන් පිළිබඳව හෙළිදරව් කිරීම් කළ යුතු වුවද සංස්ථාව විසින් ප්‍රධාන කළමනාකාරීත්වයේ පුද්ගලයන් සම්බන්ධයෙන් වන සමාලෝචිත වර්ෂයේ පාරිශ්‍රමික පිළිබඳ අදාල තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ප්‍රකාශනයන් හි ද (මූල්‍ය ප්‍රකාශන පිටු අංක 18 – 19 9 ශිර්ෂය) එසේ හෙළිදරව් කිරීමට කටයුතු කර ඇත.කෙසේ වුවද මෙහි පෙන්වා දි ඇති පරිදි පාරිශ්‍රමිකයින් පිළිබඳ තොරතුරු ඉදිරි වර්ෂයේ සිට හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. | |
| (ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 38 හි (9) වන වගන්තිය අනුව පරිගණක මෘදුකාංග අස්පෘශ්‍ය වත්කම් යටතේ හදුනා ගත යුතු වුවද 2022 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති රු.9,542,602 ක් පිරිවැය වූ පරිගණක මෘදුකාංග දේපල පිරියත හා උපකරණ යටතේ මූල්‍ය තත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි. | පරිගණක මෘදුකාංග වලට අදාල අස්පෘශ්‍ය වත්කම් යටතේ දැක්වීමට ලබන වර්ෂයේ සිට (2023) කටයුතු කරනු ලැබේ. | ප්‍රමිතියේ විධිවිධාන අනුව කටයුතු කලයුතුය |

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන රු.203,341,539 ක් වූ තොග වටිනාකම තුල ඇතුලත් වර්ෂ කිහිපයක සිට පැවත එන චලනය නොවන තොග වටිනාකම රු.415,682 ක් සඳහා වෙන්කිරීමක් සිදු කිරීම හෝ නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි. | ඉදිරියේදී සිදු කරනු ලබන අපහරණ ක්‍රියා මාර්ගයකදී මෙම චලනය නොවන තොග ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ. | චලනය නොවන තොග වටිනාකම නිරවුල් කිරීමට කටයුතු කලයුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්ථාව සතු විකාශන කුලුණු භාවිතා කිරීම නිසා ලැබිය යුතු කුලිය සහ විදුලි ගාස්තු රු.11,191,484 ක් අයකර ගැනීම සඳහා සමාගම් දෙකකට එරෙහිව සංස්ථාව විසින් නඩු දෙකක් පවරා තිබුණු අතර ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට නඩු ගාස්තු වශයෙන් රු.677,550 ක් වැය කර තිබුණි.එක් නඩුවකින් රු.3,330,000 ක් සංස්ථාවට අයවිය යුතු වුවද එම වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි. | අදහස් දක්වා නැත | ලැබිය යුතු මුදල් අයකරගැනීමට අප්‍රමාදව කටයුතු කල යුතුය. |

**1.5.4 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය තුල ශුද්ධ වත්කම් රු.351,202,545 ක ඍණ අගයක් දක්වා පිරිහී ඇති අතර 2022 ජනවාරි 01 දිනට රු. 571,576,904 ක් වූ සමුච්චිත අරමුදල් ඍණ ශේෂය සමාලෝචිත වර්ෂයේ අලාභය රු.538,281,105 ක් සහ වර්ෂය තුළදී සිදුකරන ලද පෙර වර්ෂ ගැලපුම් සිදුකිරීමෙන් පසුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.1,111,944,969 ක ඍණ වටිනාකමක් දක්වා වැඩී වී තිබුණි. | අදහස් දක්වා නැත. | ආදායම් වර්ධනය කර ගැනීමට කටයුතු කලයුතුය. |
| (ආ) 2020 වර්ෂයේ රු.69,307,096 ක්වූ සංස්ථාවේ කාරක ප්‍රාග්ධන තත්වය 2021 වර්ෂයේ දී එය රු.254,309,644 ක ඍණ කාරක ප්‍රාග්ධන තත්වයක් දක්වා පහත වැටී තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුල දී ඍණ කාරක ප්‍රාග්ධන තත්වය රු.567,595,278 කින් තවදුරටත් වර්ධනය වී තිබුණි. ජංගම අනුපාතය සහ ක්ෂණික අනුපාතය පිළිවෙළින් 2020 වර්ෂයේ දී 1.06 ක් සහ 0.87 ක් වශයෙන්ද 2021 වර්ෂයේ දී 0.78 ක් සහ 0.6 ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුළ දී එය 0.56 සහ 0.4ක් වශයෙන් පිරිහීමට පත් වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් දිනට බැංකු අයිරා ශේෂය රු.54,103,374 අනෙකුත් මූල්‍ය වගකීම් රු. 67,783,806 කින් ඉහළ යාම වැනි කරුණු ඍණ කාරක ප්‍රාග්ධන තත්වයක් ඇතිවීමට හේතු වි ඇති බව නිරීක්ෂණය විය. 2020 වර්ෂයේ දී 4.9 ක් වූ ණය ස්කන්ධ අනුපාතය 2021 වර්ෂයේ දී 4.5 ක් හා සමාලෝචිත වර්ෂය තුල දී 1.5 ක ඍණ අවතෝලන තත්වයක් බවට පත් වී තිබුණු අතර මෙසේ අඛණ්ඩව අලාභ ලබන තත්වය හේතුවෙන් ස්කන්ධය අඩුවීම සහ සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම අවදානමට ලක් වී තිබුණි. | අදහස් දක්වා නැත. | ආදායම් වර්ධනය කර ගැනීමට කටයුතු කලයුතුය |

**1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | | (අ) 2022 වර්ෂයේ විගණනය සඳහා ඉල්ලුම් කරන ලද පහත තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.<br>(i) සංස්ථා සේවකයින්ට ගෙවන ලද ප්‍රවාහන දීමනාව<br>(ii)වාහන උපයෝජනයට අදාල තොරතුරු<br>(iii)ගාස්තු අයකිරීමකින් තොරව විකාශය කරන ලද වැඩසටහන් පිළිබඳ විස්තර<br>(iv)2022 වර්ෂයේ දී මිලදී ගන්නා ලද ටෙලි නාට්‍ය වලට අදාල ප්‍රසම්පාදන ලිපිගොනු | අදහස් දක්වා නැත. | විගණනය සඳහා ඉල්ලුම් කරන ලද තොරතුරු නොපමාව ඉදිරිපත් කලයුතුය. |
| | | (ආ) මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු. 344,739,442 ක් වු ජංගම ගිණුම් අයිරා ශේෂ තහවුරු කර ගැනීම සඳහා බැංකු ශේෂ සනාථන විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු.344,739,442.00 ක් වූ අයිරා ශේෂය මුදල් පොතට අනුව ශේෂය වේ. එය තහවුරු කර ගැනීම සඳහා අවසන් දිනට පිළියෙල කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශයයන් විගණන අංශයට ලබා දී ඇත.එහි මුදල් පොතට අනුව ශේෂය මෙන්ම බැංකු ගිණුම් ප්‍රකාශනයට අනුව ශේෂයන් සඳහන් වී ඇත.එමගින් මෙම ශේෂයන් තහවුරු කර ගැනීමට හැකි වේ.<br>තවද මූල්‍ය ප්‍රකාශයන්හි දැක්වෙන මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශයෙන්ද මෙම ශේෂය තහවුරු කරගත හැක.එමෙන්ම ශේෂ පිරික්සුමෙහි බැංකු ගිණුම් දෙක අතර වෙනසින් මෙම ශේෂයන්හි නිවැරදිතාවය තහවුරු කර ගත හැක. | විගණනය සඳහා ඉල්ලුම් කරන ලද තොරතුරු නොපමාව ඉදිරිපත් කලයුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය අවසන් දිනට සේවදායක ණයගැති ශේෂය රු.333,760,980 ක් විය.ඉන් රු.133,852,987 ක් රාජ්‍ය ආයතන මඟින් ද රු. 199,907,993 ක් පෞද්ගලික ආයතන මගින් ද නියෝජනය වී තිබුණි.ඉන් එකතු වටිනාකම රු. 4,435,184 සඳහා පමණක් ණය ගැති ශේෂ සනාථ ඉදිරිපත් කර තිබුණු අතර ඒ අනුව රාජ්‍ය ආයතන මඟින් නියෝජනය වූ එකතු වටිනාකම රු. 129,871,825 ක ණය ගැති ශේෂ සහ පෞද්ගලික ආයතන මගින් නියෝජනය වූ එකතු වටිනාකම රු.199,453,972 ක අනෙකුත් ණය ගැති ශේෂ විගණනයට තහවුරු කිරීමට කළමනාකරණය අපොහොසත් විය. | අදහස් දක්වා නැත. | විගණනයට ඍජුව ලැබෙන සේ ශේෂ සනාථන කැඳවිය යුතුය. |
| (ආ) 2022 දෙසැම්බර් 31 දින වන විට සංස්ථාව විසින් සේවාදායක ණයගැතියන් 12 දෙනෙකුට එරෙහිව නඩු පවරා තිබුණු අතර එම නඩු මඟින් සංස්ථාව අයකර ගැනීමට අපේක්ෂිත මුදල රු.34,991,769 ක් විය. මෙම නඩු සඳහා සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.1,607,000 වැයකර තිබුණි. කාලාවරෝධ පනත අනුව වසර 06 ඉක්මවීමට ප්‍රථම ණයගැති ශේෂ අයකරගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට වසර 4 ඉක්මවූ ණයගැති ශේෂය මුළු ණයගැති ශේෂයෙන් සියයට 40 ක් එනම් රු.132,148,582 ක් වූවත් එම ශේෂයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබුණේ රු.20,488,346 ක් සඳහා පමණි. | අදහස් දක්වා නැත. | ණය අයකරගැනීමට අප්‍රමාදව කටයුතු කල යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසන් දින දක්වා සංස්ථාව විසින් දේශීය | අදහස් දක්වා නැත. | ගෙවිය යුතු බදු ගෙවීමට |

| | |
|---|---|
| ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු එකතු කල අගය මත බදු බැදියාව රු.314,285,876 ක් වු අතර මින් රු.44,682,510 ක් 2022 වර්ෂයේ ගෙවිය යුතු එකතු කල අගය මත බදු වගකීම වේ. | අප්‍රමාදව කටයුතු කල යුතුය |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | | | |
| (i) | සංශෝධිත මුදල් රෙගුලාසි 371(2) (ආ) වගන්තිය | එක් අවස්ථාවක දී ලබා දිය හැකි උපරිම තත්කාර්ය අතුරු අග්‍රිමය රු. 100,000 ක් වූවද වැඩසටහන්, නවාතැන් පහසුකම් සැපයීම් සහ මිල දී ගැනීම් වැනි කටයුතු සඳහා අවස්ථා 117 කදී සීමාව ඉක්මවා රු. 54,717,124 ක තත්කාර්ය අතුරු අග්‍රිම ලබා දි තිබුණි. | අදහස් දක්වා නැත | චක්‍ර ලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය |
| (ii) | සංශෝධිත මුදල් රෙගුලාසි 371(2) (ආ) සහ 371 (5) වගන්තිය | අදාළ කාර්ය නිමකර දින 10ක් ඇතුළත ලබාගත් අතුරු අග්‍රිමය පියවිය යුතු වුවත් , සමාලෝචිත වර්ෂය අවසානය වන විට වර්ෂය ඉක්මවූ අත්තිකාරම් ශේෂය රු.16,277,172 ක් විය. | අදහස් දක්වා නැත. | චක්‍ර ලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 1.8 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් දිනට ජංගම ගිණුම් දෙකකට අදාලව බැංකු අයිරාව පිළිවෙළින් රු. 231,076,126 ක් සහ 113,663,316 ක් වූ අතර ඒ සඳහා රු. 22,793,178 ක අයිරා පොළී සංස්ථාව විසින් ගෙවා තිබුණි.එසේම එක් ජංගම ගිණුමකට අදාලව සමාලෝචිත වර්ෂයේ මාස 08 ක් අනුමත අයිරා සීමාව වරින් වර ඉක්මවා තිබුණි. | අදහස් දක්වා නැත. | මුදල් නිසිපරිදි කළමණාකරණය කල යුතුය |

### 1.9 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 03.(1) වගන්තිය අනුව, වැඩිපුර ගෙවන ලද ආර්ථික සේවා ගාස්තු අදාල වර්ෂයේ හෝ ඊට පසුව එළඹෙන වර්ෂ 02 ක් තුල දී ආදායම් බදු ගෙවීම්වලට හිලව් කර ගත හැකි වුවද 2018 හා 2019 වර්ෂයන් තුල දී රු.21,030,312 ක් සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල අයකරගතයුතු අත්තිකාරම් හා තැන්පතු යටතේ දක්වා තිබීම හේතුවෙන් එම වටිනාකමින් මූල්‍ය තත්වය අධිතක්සේරු වී තිබුණි. | පසුගිය වර්ෂවලදී සංස්ථාව අලාභයක් වාර්තා කල බැවින් ආදායම් බදු ගෙවීමක් සිදු නොවුණි. එම නිසා ගෙවන ලද ආර්ථික සේවා ගාස්තු හිලව් කර ගැනිමට නොහැකි විය.එබැවින් එම ආර්ථික සේවා ගාස්තු ගෙවිය යුතු වෙනත් බදු සඳහා හිලව් කිරිම පිළිබඳව දේශිය ආදායම් දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කිරිමට ඉදිරියේදි පියවර ගනු ලැබේ. | මූල්‍ය තත්වය නිවැරදිව දැක්වීමට කටයුතු කලයුතුය. |

### 1.10 තොරතුරු තාක්ෂණ (IT) පොදු පාලන ක්‍රම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සංස්ථාවට අයත් දෘෂ්‍ය මාධ්‍යයේ වැඩසටහන් ගබඩා කර ,අවශ්‍ය අවස්ථා වල දී නැවත නිකුත් කිරීම සඳහා සංරක්ෂිතව පවත්වාගෙන යන සංස්ථාවේ දර්ශන පුස්තකාලය තුල (Visual Library 1 & 2) පවත්නා පුස්තකාල අන්තර්ගතය මාධ්‍ය ආයතනයක් වශයෙන් සංස්ථාවේ ප්‍රධාන වත්කමක් වන අතර පැරණි තාක්ෂණය වෙනස් වීමත් සමඟ එම තාක්ෂණය යටතේ ඇති දෘෂ්‍ය ගොනු නව තාක්ෂණික ආකෘති වලට පරිවර්තනය කරමින් තාක්ෂණය සමඟ පුස්තකාල අන්තර්ගතය යාවත්කාලීන කර ගැනීම තුල වටිනා වැඩසටහන් ආරක්ෂා කල යුතු වුවද සංස්ථාව ආරම්භයේ සිට 1996 වර්ෂය දක්වා පැවති ඇනලොග් තාක්ෂණය යටතේ ක්‍රියාකරනු ලබන දෘෂ්‍ය තැටි (VRT, BETA,UMATIC ආකෘති) 2700ක් මෙතෙක් නව තාක්ෂණය වෙත මාරු කිරීමක් කර නොතිබුණි. | අදහස් දක්වා නැත. | සංස්ථාවේ අනන්‍යතාව ආරක්ෂා කර ගැනීමට කටයුතු කලයුතුය |
| (ආ)1982වර්ෂයේ ආරම්භ කරන ලද අනෙකුත් මාධ්‍ය ආයතන වලට නොමැති දීර්ඝ ඉතිහාසයක් ඇති ආයතනයක් ලෙස සංස්ථාව සතු වැදගත් උපස්ථ ගොනු පවත්වාගෙන යාමට විධිමත් | අදහස් දක්වා නැත. | වත්කම්වල ආරක්ෂාව තහවුරු වන පරිදි කටයුතු කලයුතුය. |

| | | | |
|---|---|---|---|
| | වැඩපිළිවෙලක් නිසි අන්දමින් ක්‍රියාත්මක නොකිරීම නිසා ඉහත දැක් වූ යල් පැනගිය දෘෂ්‍ය තැටි අතුරින් තැටි 211 ක් නව තාක්ෂණය වෙත මාරු කල නොහැකි පරිදි පුස් හා දිලීර (Fungus) ඇතිවීම මත භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත් වී තිබුණි.ඒ හේතුවෙන් දුර්ලභ වැදගත්කමකින් යුතු දර්ශන සංස්ථා භාවිතයට මෙන්ම අවශ්‍යතාවය මත අනෙකුත් මාධ්‍ය ආයතන වලට ලබා දීමෙන් අමතර ආදායමක් ලබා ගැනීමට තිබූ අවස්ථා සංස්ථාව විසින් මගහරවා ගෙන තිබුණි. | | |
| (ඇ) | ඉහල ප්‍රමිතියක් මෙන්ම ඉහල ප්‍රේක්ෂක ආකර්ෂණයකට ද හිමිකම් කියන සංස්ථාව විසින් හඬ කවා විකාශය කරන ලද විදේශීය ටෙලි නාට්‍ය හා ළමා කාටූන් වැඩසටහන් බොහොමයක් වෙනත් යූ ටියුබ් නාලිකා විශාල ප්‍රමාණයක සංස්ථා ලාංඡනය සහිතව ඒ ආකාරයෙන්ම විකාශනය වන බව දක්නට ලැබුණු අතර රූ අලෙවිසැලෙහි අලෙවි නොවන, සංස්ථාවේ දර්ශන පුස්තකාලයෙන් පමණක් ලබා ගත හැකි කාටූන් වැඩසටහන් හා විදේශීය ටෙලි නාට්‍ය දෘශ්‍ය තැටි බාහිර පාර්ශවයන් අතට පත්වීම වලක්වා ගැනීම සඳහා විධිමත් ආරක්ෂණ වැඩපිළිවෙලක් හා අභ්‍යන්තර පාලන ක්‍රම ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය කෙරෙහි සංස්ථාවේ අවධානය යොමුවී නොතිබුණි. | අදහස් දක්වා නැත. | සංස්ථාවේ අනන්‍යතාව ආරක්ෂා කර ගැනීමට කටයුතු කලයුතුය |
| (ඈ) | සංස්ථාවේ දර්ශන පුස්තකාලය (Visual Library) හා කැසට් පුස්තකාලයේ (Cassette Library) අන්තර්ගතය පරිශීලනය කරන පුද්ගලයින් පහසුවෙන් හඳුනා ගැනීමට හැකි වන පරිදි (Library Access) විධිමත් අධිකාරී බලයක් ඇති කිරීමට හා පිටතින් රැගෙන එන USB Drives සංස්ථාවේ පරිඝනක පද්ධතියට සම්බන්ධ කිරීමට නොහැකි පරිදි සංස්ථාව සුදුසු ආරක්ෂණ වැඩපිළිවෙලක් ස්ථාපිත කිරීමටත් සංස්ථාව විසින් නිෂ්පාදනය කරනු ලබන වැඩසටහන් සංස්කරණය කිරීම සංස්ථාවේ සංස්කරණ මැදිරි තුලම සිදු කිරීමට අවශ්‍ය පහසුකම් සලසා දීමට සහ සංස්කරණ කටයුතු සඳහා පිටතට ගෙනයාම වැලැක්වීමට අවශ්‍ය නීති රීති ස්ථාපනය කිරීම තුලින් | අදහස් දක්වා නැත. | සංස්ථාවේ අනන්‍යතාව ආරක්ෂා කර ගැනීමට කටයුතු කලයුතුය |

සංස්ථාවේ අන්තර්ගතය ආරක්ෂා කර ගැනීමටත් සංස්ථාව කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.538,281,105 ක පාඩුවක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ පාඩුව රු.227,342,397 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.310,938,708 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ගුවන් කාල විකුණුම් ආදායම රු.221,189,415කින් පහත වැටීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ගුවන් කාල විකුණුම් ආදායම සියයට 19කින් පහත වැටී තිබුණු අතර අධ්‍යාපනික වැඩසටහන් ගුවන් කාල විකුණුම් ආදායම සියයට 85කින් පහත වැටීම ඊට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. ඉකුත් වසරට සාපේක්ෂව වෙනත් මෙහෙයුම් ආදායම් සියයට 12කින් ඉහළ ගොස් ඇති අතර වෙනත් මෙහෙයුම් ආදායම් තුළ ඇතුළත් කර ඇති ප්‍රාග්ධන අයිතම් සඳහා ලබා දෙන රාජ්‍ය ප්‍රදාන සියයට 42 කින් ඉහළ යාමත්, නැණමිහිර ප්‍රශ්නපත්‍ර අලෙවි ආදායම සියයට 51කින් ඉහළ යාමත්, පෙර වසරේ නොපැවති රංගපුහුණු පාඨමාලා ආදායම, බෞද්ධ වැඩසටහන් හා සංගීත වැඩසටහන් ආදායම රු.12,051,076ක්ද පැවතීමත් ඊට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ බෙදාහැරීමේ වියදම් සියයට 45 කින් පහළ ගොස් තිබුණු අතර ඒජන්සි කොමිස් මුදල් සියයට 41කින් අඩුවීම ඊට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.පරිපාලන වියදම් සියයට 0.48කින් කින් පහළ ගොස් තිබුණි. මූල්‍ය හා වෙනත් වියදම් සියයට 31කින් ඉහළ ගොස් තිබුණු අතර බැංකු ණය පොළී සියයට 52කින් ඉහළ යාම හා නෛතික ගාස්තු සියයට 597කින් ඉහළ යාම ඊට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

2021 වර්ෂයේ දී ජංගම අනුපාතය සහ ක්ෂණික අනුපාතය පිළිවෙළින් 0.78 ක් සහ 0.6 ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුළ දී එය 0.56 සහ 0.4ක් වශයෙන් පිරිහීමට පත් වී තිබුණි. 2021 වර්ෂයේ දී සංස්ථාවේ සෘණ කාරක ප්‍රාග්ධන තත්වය රු.254,309,644 ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුල දී එය සෘණ රු.567,596,278 දක්වා තවදුරටත් ඉහළ ගොස් තිබුණි.සමාලෝචිත වර්ෂය අවසන් දිනට බැංකු අයිරා ශේෂය රු.54,103,374 කින් හා අනෙකුත් මූල්‍ය වගකීම් රු. 67,783,806 කින් ඉහළ යාම වැනි කරුණු සෘණ කාරක ප්‍රාග්ධන තත්වයක් ඇතිවීමට හේතු වී ඇති බව නිරීක්ෂණය විය.

ඉකුත් වර්ෂයේදී සියයට සෘණ 6.3 ක් වූ දළ ලාභ අනුපාතය, සමාලෝචිත වර්ෂයේදී සියයට සෘණ 32.6 ක් වූ අතර ශුද්ධ ලාභ අනුපාතය 2021 වර්ෂයේදී සියයට සෘණ 19.7 ක් ද සමාලෝචිත වර්ෂයේදී සියයට සෘණ 57 ක්ද විය. ගුවන් කාල විකිණුම් ආදායම පහත වැටීම ඊට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.
2021 වර්ෂයේ දී ණය ස්කන්ධ අනුපාතය 4.5ක අධිතෝලන තත්වයක් වූ අතර සමාලෝචිත වර්ෂය තුල දී එය සෘණ 1.5 ක අධිතෝලන තත්වයක් බවට පත් වී තිබුණි. දිගුකාලීන වගකීම් අඩුවීමට සාපේක්ෂව අඛණ්ඩව ලබන අලාභ තත්වය හේතුවෙන් ස්කන්ධය සෘණ අගයක් දක්වා අඩුවීම ඊට හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට සංස්ථා නිලධාරීන් 106 දෙනෙකු විසින් | අදහස් දක්වා නැත. | ආපසු භාර දියයුතු කැසට්පට ලබාගැනීම |

| | | |
|---|---|---|
| සංස්ථාව වෙත ආපසු භාර නොදුන් කැසට්පට සංඛ්‍යාව 819 ක් වන අතර ඒවායේ වටිනාකම රු.2,375,991 කි. | | සඳහා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කලයුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) සංස්ථාවේ සභාපති අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්, අධ්‍යක්ෂ ජනරාල් /ප්‍රධාන විධායක නිලධාරී/ක්‍රියාකාරී අධ්‍යක්ෂ යන නිලධාරී කාණ්ඩවල රාජකාරී කටයුතු කරනු ලබන නිලධාරීන්ගේ ගෘහස්ථ පරිහරණයට රූපවාහිනී යන්ත්‍ර, ඩීවීඩී යන්ත්‍ර සහ ඊට අමතරව දුරකථන ටැබ් පරිගණක ආදිය ලබා දී සේවය කළ යුතු අවම සේවා කාලයක් හෝ වෙනත් විධිමත් නිර්ණායකයක් පිළිබඳව සැලකීමකින් තොරව සේවය අවසන් කිරීමේ දී ඉතා සුළු වටිනාකමක් ගෙවා රැගෙන යාමට අවස්ථාව ලබා දීම සංස්ථාවේ සාමාන්‍ය ක්‍රමවේදය වී තිබුණි . පසුගිය වර්ෂ කිහිපයක සිටම සංස්ථාවේ සභාපති අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් හා අධ්‍යක්ෂ ජනරාල්වරුන් ඉතා කෙටිකාලයක් තුල සංස්ථාවට සිය සේවය සැපයීමේ ප්‍රවණතාවයක් නිරීක්ෂණය වූ අතර එසේ ඉතා කෙටි කාලයකින් පසුව සේවයෙන් ඉවත්ව යාමේ දී රූපවාහිනී යන්ත්‍රය හා ඩීවීඩී යන්ත්‍රය රැගෙන යාම හේතුවෙන් ඉන් පසු නැවත තනතුරට පැමිණෙන නිලධාරීන් හට දිගින් දිගටම නව රූපවාහිනී යන්ත්‍රයක් හා ඩීවීඩී යන්ත්‍රයක් ලබා දීමට සිදු වීම සංස්ථාවේ මූල්‍ය තත්වයට අයහපත් ලෙස බලපා තිබුණි. | අදහස් දක්වා නැත | සංස්ථාවේ මූල්‍ය තත්වය යහපත් අන්දමින් පවත්වා ගැනීමට කටයුතු කලයුතුය |

| | | |
|---|---|---|
| (ආ) විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව වැඩසටහන් අංශය යටතේ ඇති උප ඒකක වල නිෂ්පාදකවරුන් 18 දෙනෙකුගෙන් 2022 වර්ෂය තුළදී ප්‍රමාණවත් නිර්මාණ සිදුවී නොතිබුණි. | අදහස් දක්වා නැත | මානව සම්පත කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය වන අන්දමින් කටයුතු කල යුතුය. |
| (ඇ) සංස්ථාව වර්තමානයේ මුහුණදෙමින් සිටින මූල්‍ය අර්බුදය මගහරවාගැනීම උදෙසා ආදායම් ඉහළ නංවා ගැනීමත් වියදම් කළමණාකරණය කරගැනීමත් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වුවද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී ඒ පිළිබඳව වැඩි අවධානයක් යොමුකර නොතිබුණු අතර ඒ වෙනුවට සේවක පත්වීම්, උසස් කිරීම්,දීමනා වැඩිකරගැනීම්, විදේශ නිවාඩු අනුමත කරගැනීම් ආදී කාර්යමණ්ඩල ගැටළු නිරාකරණය කර ගැනීම උදෙසා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී වැඩි අවධානයක් යොමුකර තිබුණි. | අදහස් දක්වා නැත. | සංස්ථාව වර්තමානයේ මුහුණදෙමින් සිටින මූල්‍ය අර්බුදය මගහරවාගැනීමට කටයුතු කල යුතුය. |
| (ඈ) ඕනෑම ආයතනයකට බාහිරින් පැමිණෙන පාර්ශවයකට ආයතනික ප්‍රතිරූපය පිළිබඳව මූලික අදහසක් ලැබෙනුයේ පිළිගැනීමේ අංශය තුළිනි. පිළිගැනීමේ අංශයේ කාර්යමණ්ඩලයේ කාරය භාරය වනුයේ පිටතින් පැමිණෙන පාර්ශවයන් සුහදශීලිව හා ප්‍රියමනාප අයුරින් පිළිගෙන ඔවුන්ගේ අවශ්‍යතාවය කඩිනමින් ඉටුකර ගැනීමට අවශ්‍ය මඟපෙන්වීම ලබා දීමයි. එසේ වුවද පිලිගත් රාජ්‍ය ආයතනයක් ලෙස එහි ප්‍රතිරූපය ආරක්ෂා වන අන්දමින් පිළිගැනීමේ නිලධාරී තනතුරට ගැලපෙන නිලධාරීන් සංස්ථාවේ පිළිගැනීමේ කාර්යමණ්ඩලයට අනුයුක්ත කිරීමට සංස්ථා කළමනාකරණය අපොහොසත් වී තිබුණි. | අදහස් දක්වා නැත. | තනතුරට අදාල වගකීම ඉටුකිරීම සඳහා සුදුසුකම් ඇති නිලධාරීන් අනුයුක්ත කිරීමට කටයුතු කල යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාව විසින් දේශීය ටෙලිනාට්‍ය 03 ක් රු.20,958,000 කට මිලදී ගෙන ගුවන් කාල ආදායම ලෙස රු.13,408,260ක් උපයා තිබුණ ද එම ටෙලිනාට්‍ය විකාශය සඳහා දරන ලද මුළු වියදම රු.22,969,239 ක් වූ බැවින් දේශීය ටෙලිනාට්‍ය විකාශන අලාභය රු.9,560,979ක් විය. වර්ෂය තුළදී ඒකාංගික ටෙලිනාට්‍ය 06ක් නිෂ්පාදනය කර විකාශය කර තිබූ අතර නාට්‍ය 05ක්ම අලාභ ලබා තිබුණි. ඒ වෙනුවෙන් දැරූ මුළු වියදම රු.1,370,152ක් වූ ඉන් අතර ගුවන්කාල ආදායම ලෙස රු.661,147ක් පමණක් උපයා තිබුණු බැවින් මුළු අලාභය රු.709,005ක් විය. වර්ෂය තුළදී විකාශය කරන ලද විදේශීය ටෙලිනාට්‍ය 03 කින් 02ක වියදම රු.4,978,270 ක්වූ අතර ඉන් ඉපයූ ආදායම රු.3,727,800ක් පමණක් වූයෙන් රු 1,250,470ක අලාභයක් ලබා තිබුණි. | අදහස් දක්වා නැත. | අලාභ අවම කරගැනීමට කටයුතු කලයුතුය. |
| (ආ) | යම් ඉලක්කයක් සපුරා ගැනීම උදෙසා එම අදාල කාලපරිච්ඡේදය ආරම්භයට පෙර ඉලක්ක හඳුනා ගෙන එය ළඟා කර ගැනීම සඳහා කටයුතු කර කාලපරිච්ඡේදය අවසානයේ ප්‍රතිඵලය අගය කල යුතු වුවද, සංස්ථාවේ අලෙවි අංශය විසින් එකිනෙක මාසය ආරම්භයේදී අලෙවි විධායකයින් වෙත අලෙවි ඉලක්ක ලබා දීමක් සිදුකර නොතිබුණු අතර ඒ වෙනුවට මාසය අවසානයේ ලඟා කර ගත් ප්‍රතිඵලය එම මාසයේ ඉලක්කය ලෙස දැක්වීමේ ක්‍රමවේදයක් අනුගමනය කර තිබුණි. | අදහස් දක්වා නැත. | අලෙවි ඉලක්ක ලබා දීම කාලපරිච්ඡේදය ආරම්භයේ සිදු කල යුතුය. |
| (ඇ) | සංස්ථාවේ අලෙවි අංශයේ මානව සම්පත කාර්යක්ෂමව හා සඵලදායීව මෙහෙයවීමේ වගකීම් අධ්‍යක්ෂ (අලෙවි)වෙත පැවරෙන කාර්යභාරයේ ඉතා වැදගත් අංශයක් වුවද සංස්ථා අලෙවි විධායක නිලධාරීන් සෑම වර්ෂයකම වැටුප් රහිත නිවාඩු ලබා ගැනීම, දෛනික සේවයට පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් විධිමත්ව සටහන් නොකිරීම,කාර්යසාධනය පහළ මට්ටමක පැවතීම වැනි කරුණු නිරීක්ෂණය වූ අතර ඒ පිලිබඳ අධ්‍යක්ෂ (අලෙවි)ගේ නිසි අවධානය යොමු වී නොතිබුණි. | අදහස් දක්වා නැත. | අලෙවි අංශයේ මානව සම්පත කාර්යක්ෂමව හා සඵලදායීව මෙහෙයවීමට කටයුතු කලයුතුය. |

| | | |
|---|---|---|
| (ඈ) සමාලෝචිත වර්ෂය අවසානය වන විට සංස්ථාවට එරෙහිව සේවකයින් හා බාහිර පාර්ශව විසින් නඩු 15 ක් පවරා තිබුණු අතර ඉන් නඩු 07 කට අදාලව පැමිණිලි පාර්ශවය විසින් ඉල්ලා තිබුණු වන්දි මුදල රු.933,000,000 ක් විය.මෙම නඩු කටයුතු සඳහා සමාලෝචිත වර්ෂය අවසාන දින වනවිට නීතිඥ ගාස්තු වශයෙන් රු.6,188,540 ක් වැය කර තිබුණි. | අදහස් දක්වා නැත. | සංස්ථාවට සිදුවිය හැකි අලාභ මගහරවා ගැනීමට කටයුතු කලයුතුය |
| (ඉ) 1971 අංක 38 දරන මුදල් පනතේ 7(1) ඡේදයේ සඳහන් පරිදි ආදායම් ගිණුමේ අන්ත අතිරික්තය එම ගිණුමේ අන්ත ඌනය අවුරුදු 5 ක කාල සීමාවක් තුළ හෝ මුදල් ඇමතිවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි මොනයම් කාලසීමාවක් තුළ පියවීමට ප්‍රමාණවත් වන පරිදි නීතිගත සංස්ථාවේ කටයුතු පවත්වාගෙන යාම එම නීතිගත සංස්ථාවේ පාලක මණ්ඩලයේ වගකීම වුවද ආසන්නතම වර්ෂ පහක ශුද්ධ අලාභය රු.1,312,287,598 ක් වූයෙන් සංස්ථාවේ ක්‍රියාකාරීත්වය එම අපේක්ෂිත තත්වයට ළඟාවී නොමැති බව නිරීක්ෂණය විය. | අදහස් දක්වා නැත | මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු අතර අලාභ තත්වය මගහරවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ සේවක වැටුප් වියදම පෙර වර්ෂයට සාපේක්ෂව රු.30,667,506 කින් වැඩි වී තිබුණු අතර 2021 වර්ෂයට සාපේක්ෂව මෙහෙයුම් වියදම සමාලෝචිත වර්ෂයේදී සියයට 137 කින් වැඩි වී තිබුණ ද සමාලෝචිත වර්ෂයේ ආදායම 2021 වර්ෂයට සාපේක්ෂව රු.182,119,548 කින් අඩු වී තිබුණි. | අදහස් දක්වා නැත | ආදායම ඉහල නංවාගැනීමට කටයුතු කලයුතුය. |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තිය ප්‍රකාරව අස්ථිත්වය විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර එහි අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු හා ඊළග වර්ෂයේ ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව පිළියෙල කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දී ඉටුකර ගැනීම සඳහා සැලසුම් කරන ලද රු.මිලියන 41 ක ඇස්තමේන්තු ගත වටිනාකමකින් යුතු | අදහස් දක්වා නැත | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කලයුතුය. |

| | | |
|---|---|---|
| ප්‍රමුඛතා ලයිස්තුවේ ඇති කාර්යයන් 04 ක් ඇතුලත් සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම 2022 ඔක්තෝබර් 31 දින අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණි. | | |
| (ආ) තරඟාවලියක සජීවී විකාශන අයිතිය ලබා ගැනීම සඳහා එම තරඟාවලියේ විකාශන අයිතිය හිමි ආයතනය සමඟ ඍජුව සම්බන්ධ වී විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියක් අනුගමනය කර සංස්ථාවට වඩාත් ලාභදායී ලෙස අදාල තරඟාවලියේ සජීව විකාශන අයිතිය ලබා ගත යුතු වුවද, Live Road Safety World Series T20 Cricket 2022 තරඟාවලිය සජීවී විකාශනය සඳහා සංස්ථාව විකාශන අයිතිය ලබා ගැනීමේ දී 2006 රජයේ ප්‍රසම්පාදන මාරගෝපදේශ අනුගමනය කිරීමකින් තොරව එක් ආයතනයක් සමඟ ඇ.ඩො 48, 500ක වටිනාකමකට ගිවිසුම් ගත වී තිබුණි. | අදහස් දක්වා නැත | රජයේ ප්‍රසම්පාදන මාරගෝපදේශ අනුගමනය කලයුතුය. |
| (ඇ) මෙම තරඟාවලිය 2022 සැප්තැම්බර් 10 සිට ආරම්භ වීමට නියමිතව තිබුණු අතර තරඟාවලියේ විකාශන අයිතිය සංස්ථාවට ලබා ගැනීමට සංස්ථාව කටයුතු කර ඇත්තේ2022 සැප්තැම්බර් 07 දිනදී ය. ප්‍රමාණවත් කාලයක් තුළ විධිමත් සැලසුමකට අනුව කටයුතු කිරීම තුලින් මෙවැනි කටයුත්තක් සංස්ථාවට වඩාත් ලාභදායී අන්දමින් ඉටුකර ගැනීමට කළමනාකරණය අවධානය යොමු කර නොතිබුණු අතර දින 03 ක් වැනි ඉතා කෙටි කාලයක් ඇතුළත මෙම සැපයුම්කාර ආයතනය සමග ගිවිසුම් ගත වීමට කටයුතු කර තිබුණි. | අදහස් දක්වා නැත | රජයේ ප්‍රසම්පාදන මාරගෝපදේශ අනුගමනය කලයුතුය. |
| (ඇ) මෙම තරගාවලියේ විකාශන අයිතිය දේශිය ප්‍රචාරන නියෝජිත ආයතනයකින් ලබා ගැනීම සඳහා ක්‍රිකට් ප්‍රසම්පාදන කමිටුව 2022 සැප්තැම්බර් 07දින සභාපති වෙත අභ්‍යන්තර සංදේශ ලිපියක් )Memo) ඉදිරිපත් කර අනුමැතිය ලබා ගෙන තිබුණද සංස්ථාව පළමු පාර්ශවය ලෙස Ground Pictures international FZCO නැමැති විදේශීය ආයතනය සමග ගිවිසුම් ගත වී තිබුණි. | අදහස් දක්වා නැත | රජයේ ප්‍රසම්පාදන මාරගෝපදේශ අනුගමනය කලයුතුය. |

| | | |
|---|---|---|
| (ඉ) 2022 සැප්තැම්බර් 10දින සිට මෙම තරඟාවලිය විකාශයට නියමිතව තිබුණද මෙම තරඟාවලිය විකාශයට අදාලව පසුතල සැකසීමට අවශ්‍ය Digital Print සපයා ගැනීමට P4 අනුමැතිය ලබා ගන්නා තෙක් ආවරණ අනුමැතිය ලබා ගැනීම සඳහා අදාල ජ්‍යෙෂ්ඨ නිෂ්පාදක විසින් අධ්‍යක්ෂ ජනරාල් වෙත 2022 සැප්තැම්බර් 08වන දින යොමු කර තිබුණු අතර අධ්‍යක්ෂ ජනරාල් විසින් එදිනම අනුමැතිය ලබා දී තිබුණි . එදිනම සැපයුම් කරුවන් 05දෙනෙකු වෙත විද්‍යුත් තැපැල මගින් මිල ගණන් නිකුත් කර තිබුණු අතර 2022 සැප්තැම්බර් 09දින වන විට එක් සැපයුම්කරුවෙකු පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබුණි .ඒ අනුව එම සැපයුම්කරු පසුතල සැකසීමට අවශ්‍ය Digital Print සපයා ගැනීමට එදිනම තෝරාගෙන තිබුණි .සාමාන්‍යයෙන් ජාත්‍යන්තර තරඟාවලියක් පැවැත්වෙන දින වකවානු කල්තියා තීරණය වන පසුබිමක සංස්ථාව විසින් දින 02ක් වැනි කෙටි කාලයක් තුළ විකාශයට අදාල සැපයුම් ලබා ගැනීමට කටයුතු කිරීම තුළින් තරඟකාරී මිල කැඳවීමක් යටතේ අවම පිරිවැයකින් ප්‍රශස්ථ සැපයුමක් ලබා ගැනීමට තිබූ අවස්ථාව සංස්ථාව මග හරවාගෙන තිබුණි .තවද ක්‍රීඩා තරඟ විකාශනයේ අත්දැකීම් සහිත ආයතනයක් කල්වේලා ඇතිව විධිමත් සැලසුමකට අනුව කටයුතු නොකිරීම ගැටලු සහගත වේ . | අදහස් දක්වා නැත | තරඟකාරී මිල කැඳවීමක් යටතේ අවම පිරිවැයකින් ප්‍රශස්ථ සැපයුමක් ලබා ගැනීමට කටයුතු කලයුතුය. |
| (ඊ) දෙපාර්ශවය අතර එළඹි ගිවිසුම අනුව ගිවිසුම් පාර්ශවයට මුලු විකාශන අයිතිය ලබා ගැනීම වෙනුවෙන් ඇ.ඩො . 48, 500ක් සංස්ථාව විසින් ඇ.ඩො. 24,250 බැගින් වාරික දෙකකින් ගෙවිය යුතුවේ .ගිවිසුමේ 02 ) e) වගන්තිය අනුව අදාල ගෙවීම ඇ.ඩො .වලින් ගෙවන්නේ නම් ගිවිසුමේ පළමු පාර්ශවය වන Ground Pictures international FZCO ආයතනයේ බැංකුව වන Emirates Islamic වෙත ගෙවිය යුතු බවට හා අදාල ගෙවීම ශ්‍රී ලංකා රුපියල් වලින් ගෙවන්නේ නම් ගිවිසුමේ පාර්ශවයක් නොවන U L C Broadcasting Network (Pvt) Ltd හි | අදහස් දක්වා නැත | ගිවිසුමක කොන්දේසි පැහැදිලි හා විනිවිදභාවයෙන් යුක්ත විය යුතුය. |

| | | |
|---|---|---|
| Commercial Bank Ceylon PLC වෙත ගෙවිය යුතු බවට කොන්දේසියක් ඇතුලත් කර තිබුණි .එසේ වුවද විදේශීය ආයතනයක් සමග එළඹි ගිවිසුමකට අනුව සිදු කරන ලද ගණුදෙනුවක වටිනාකම ගිවිසුමේ පාර්ශවයක් නොවන වෙනත් සමාගමක් වෙත ශ්‍රී ලංකා මුදලින් ගෙවීමට කොන්දේසියක් ඉදිරිපත් කිරීම විගණනයේ දී ගැටලු සහගත වේ. | | |
| (ඇ) මෙම තරඟාවලිය සජීවී විකාශයට අදාල ගිවිසුමේ පළමු පාර්ශවය වන Ground Pictures international FZCO ආයතනය Dubai Silicon Oasis හි ඩුබායි ඩිජිටල් පාර්ක් ගොඩනැගිල්ලෙහි පිහිටා ඇති බවට විද්‍යුත් සහතිකයක් ඉදිරිපත් කර තිබුණු අතර එම ආයතනය ඩිජිටල් අවකාශයක් තුළ ව්‍යාපාරික කටයුතු සිදු කිරීම සඳහා බලපත්‍රයක් ලබා ඇති ස්ථානයක් ලෙස දක්වා තිබුණි.එසේ වුවද Ground Pictures international FZCO හි වෙබ් අඩවියහි දුරකතන අංකයක් හෝ සඳහන්කර නොතිබුණි. මෙම තරඟාවලිය විකාශනය තුළින් රු16., 507, 500ක ආදායමක් ලබා තිබුණද වර්තමානය වන විට මෙම විකාශනය තුළින් ලද ඇස්තමේන්තුගත අලාභය රු . 8,936,333 ක් වී තිබුණි . | අදහස් දක්වා නැත | ගිවිසුම්වලට එළඹීම විධිමත් අන්දමින් සිදුවිය යුතුය. |
| (ඈ) රජයේ නාලිකාවක් ලෙස මෙම තරඟාවලියේ විකාශන අයිතිය ලබාගැනීමට සෘජුව ක්‍රියා කිරීම තුළින් සංස්ථාවට ලබා ගත හැකිව තිබූ වාසිදායක අවස්ථාවන් මඟ හරවා ගැනීමට ඉඩකඩ සැලසීම මතභේදයට තුඩු දෙන කරුණක් වන අතර මෙම ප්‍රසම්පාදනයේ විනිවිදභාවය පිළිබඳව විගණනයේ දී සෑහීමකට පත් වීමට නොහැකි විය. | අදහස් දක්වා නැත | ප්‍රසම්පාදන කටයුතු විනිවිදභාවයෙන් යුක්ත විය යුතුය. |

### 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසන් දිනට සංස්ථාවේ අනුමත ස්ථිර කාර්යමණ්ඩලය 1041ක්ද අනුමත කොන්ත්‍රාත් කාර්යමණ්ඩලය 08ක්ද වූ අතර අනුමත ස්ථිර කාර්යමණ්ඩලය 785ක් හා අනුමත කොන්ත්‍රාත් කාර්යමණ්ඩලය 16 ක් සේවයේ යොදවා තිබුණි.ඒ අනුව අනුමත ස්ථිර කාර්යමණ්ඩලයේ පුරප්පාඩු 256ක්ද අනුමත කොන්ත්‍රාත් කාර්යමණ්ඩලයේ අතිරික්තය 08 ක්ද විය.මීට අමතරව සේවා පැවරුම් පදනම මත සේවකයින් 12 දෙනෙකු ද සේවයේ යොදවා තිබුණි. අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත්ව නොතිබූ තනතුරු 15 ක් සඳහා ස්ථිර සේවකයින් 18ක්, කොන්ත්‍රාත් සේවකයින් 11ක් සහ සේවා පැවරුම් මත සේවකයින් දෙදෙනෙක් සේවා නියුක්ත කොට තිබුණි. තනතුරු 05ක අනුමත කාර්යය මණ්ඩලය ඉක්මවා ස්ථිර සේවකයින් 16ක්, කොන්ත්‍රාත් සේවකයින් 05ක් හා සේවා පැවරුම් පදනම මත සේවකයින් 10ක් සේවයේ යොදවා තිබුණි. | අදහස් දක්වා නැත. | අනුමත කාර්යමණ්ඩලයට අයත් තනතුරු වල පුරප්පාඩු පිරවීමට හා ඊට අනුගතව කටයුතු කලයුතුය. |

## 4 ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සංස්ථාවේ අනුමත කාර්යමණ්ලය තුළ අභ්‍යන්තර විගණන නිලධාරී තනතුරක් පැවතිය ද එම තනතුර 2019 මැයි 22 දින සිට පුරප්පාඩුව පැවතුණි. ඒ හේතුවෙන් අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු ඵලදායී ලෙස ඉටුකර ගැනීමට ඇති හැකියාව සීමා වී තිබුණ ද එම තනතුර පිරවීම සඳහා සංස්ථාව විසින් මෙම වාර්තාවේ දිනය දක්වා කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නැත. | පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කලයුතුය. |